# ස්වෙච්ඡා සංවිධාන: මෙරටේ අත්දැකීම්

ස්වෙච්ඡා සංවිධාන යනුවෙන් හැඳින්වෙන්නේ ලාභාපේක්ෂාවෙන් තොරව, යම් ජන කොටසකට පොදුවේ සෙතක් බලාපොරොත්තුවෙන් එම ජනකොටස විසින් පොදු සේවයක් ඉටු කිරීමට ඇති කර ගන්නා සංවිධානයන් ය. මේ අනුව බලන කල ඈත අතීතයේ සිටම ස්වෙච්ඡා සංවිධාන ජනතාවට හුරු පුරුදු ඒවා බව පැහැදිලිය. සාමූහික දිවි පෙවෙතකට හුරු පුරුදුවූ මෙරටේ ජනතාව පොදු කටයුතු ඉටු කර ගත්තේ ස්වෙච්ඡා පදනමකිනි. තම අසල් වැසියාගේ හේන්, කෙත් වතු වල, වැඩ කටයුතු වලට හවුල්වීමේ සිට සුළු වාරි මාර්ග, මහා වාරි මාර්ග නඩත්තුව, මංමාවත් ඉදි කිරීම හා නඩත්තුව වැනි වැඩ කටයුතු වලට පමණක් නොව, පූජනීය ස්ථාන වල සේවා කටයුතු සඳහාද ජනතාව ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වූහ. පාලන බලය සහිත ස්වෙච්ඡා සංවිධානයක් වන ඓතිහාසික ගම්සභා ක්‍රමය 9 වැනි හෝ 10 වැනි සියවස් වල සිට පැවැතුණු බවට ඓතිහාසික සාක්ෂි ඇත.

මේ අනුව වාරිමාර්ග, ජල පාලනය හා වගාකටයුතු සඳහාද සමාජීය ආරවුල් නිරවුල් කිරීම, මෙන්ම ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු ඉටු කරනු සඳහා ද කැපවුන ප්‍රජා සංවිධාන, ශ්‍රී ලාංකික සමාජ ක්‍රියාවලියේ ඒකාබද්ධ කොටසක්ව පැවැති බව අනාවරණය වෙයි. සමාජයේ චාරිත්‍ර වාරිත්‍ර සම්ප්‍රදාය හා ප්‍රජාවගේ පිළිගැනීම මත, ගොඩ නැඟුනු මෙම සංවිධාන ගම් මට්ටමෙන් මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් පැවැති බවට සාක්ෂි ඇත. එබඳු සංවිධාන වත්මන් සංවර්ධන විශේෂඥයන් හඳුන්වා දෙනු ලබන්නේ ප්‍රාථමික මට්ටමේ සංවිධාන ලෙසිනි.

ස්වෙච්ඡා සංවිධාන පිළිබඳව මෙබඳු දීර්ග අත්දැකීමක් අපේ රට සතුව තිබුනද වත්මන් සංවර්ධන විශේෂඥයින් විසින් ද්විතියක මට්ටමේ සංවිධාන ලෙස හඳුන්වනු ලබන ජාතික මට්ටමේ සංවිධාන බිහි වූයේ මෑතදීය. සමහර සංවිධාන වල ඉතිහාසය 19 වැනි සියවස තෙක් හෝ 20 වන සියවසේ මුල් භාගය දක්වා විහිදෙනු දැකිය හැකි වුවද, මෙම සංවිධාන යන්ගෙන් බහුතරය ගතවූ පනස් වසර තුළ බිහිවී ඇත.

මෙම කාලයේදී මෙබඳු සංවිධාන බිහි වීමට බලපෑ සමාජ ආර්ථික බලවේග ලෙස සැළකිය හැක්කේ 1930 ගණන්වලදී දේශීය ප්‍රභූන් පාලනයට හවුල් වීමත්, එම කාලය තුළදී ඇතිවූ මැලේරියාව වසංගතය ග්‍රාමීය ජනතාවගේ සමාජ

□

මෙරටේ ස්වෙච්ඡා ආයතන පිළිබඳව විස්තර කිරීම දුෂ්කර කටයුත්තක් වෙයි. දිවයින පුරා විවිධ ව්‍යාපාර ගෙන යන සංවිධාන විශාල ප්‍රමාණයක් මෙරටේ නිරතවී ඇති හෙයින් එම ආයතනවල සැබෑ ස්වරූපයක් පෙන්නුම් කෙරෙන යථා තොරතුරු ඉතා දුලභය. එලෙසින්ම මෙම ආයතනවල කටයුතු වල ඇති විවිධත්වය නිසා මෙබඳු ලිපියකින් එම කටයුතු සංක්ෂිප්ත කිරීමද පහසු කටයුත්තක් නොවේ. මෙම බාධාවන් දෙස සැලකිල්ල යොමුකරමින් සකස් කරන ලද මෙම ලිපියේ පරමාර්ථය වනුයේ මෙරටේ ස්වෙච්ඡා සංවිධාන වල කාර්ය භාරය පිළිබඳව දළ අදහසක් පාඨකයනට ලබාදීමය. මෙම ලිපිය සකස් කිරීමේදී මහාචාර්ය එස්. තිලකරත්න මහතාගේ ලේඛණ රැසක් උපයෝගි කරගන්නා ලදී. කෙසේ වෙතත් මෙහි වගකීම ලේඛකයා සතුය.

□



මෙබඳු තරුණ පරපුර සඳහාද පොදු සංවිධාන බිහිවී ඇත.

ආර්ථික තත්ත්වය කෙරේ අවධානය යොමු කිරීමට බලකිරීමත් ය. ලංකාවේ ඇතිවූ ස්වේච්ඡා සංවිධාන, ඉතිහාසයේ සිටම විවිධ ස්වරූප ගනී. මුල් යුගයේ බිහිවූ සංවිධාන දළ වශයෙන් මෙසේ වර්ගකළ හැකිය.

### i. ආගමික සංවිධාන :

මෙරටේ බිහිවූ පළමුවන ස්වේච්ඡා සංවිධාන වන්නේ ආගමික සංවිධානයන් ය. පාසැල් විශාල සංඛ්‍යාවක් බිහි කරමින් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි වැදගත් සේවාවක් ඉටුකළ ක්‍රිස්තියානි මිෂනාරි සමාජ 19 වැනි සියවසේ මුල් භාගයේ සිට බිහිවූ බව පෙනේ. 1880 දී බිහිවූ තරුණ ක්‍රිස්තියානි සංගමය හා තරුණ ක්‍රිස්තියානි කාන්තා සංගමය සමාජ හා සුබසාධක කටයුතු වල නියැලුනහ. මේ සමගම, අධ්‍යාපන හා සමාජ සේවා වල නියැලෙනු පිණිස අනෙක් ආගමික යන්ද ඔවුන්ගේ සංවිධාන පිහිටුවා ගන්නා ලදී. පරම විඥානාර්ථබෞද්ධ සංගමය (1887) විවේකානන්ද සමාජය (1902) රාමක්‍රිෂ්ණ මිසම (1929) හා මුස්ලිම් අධ්‍යාපන සමාජය (1890) මෙයට නිදසුන් ය. පසු කලෙක මෙම සමිති ව්‍යාප්ත වීමත් සමග සමිති සම්මේලන බවට පත්විය.

### ii. සමාජ සේවා සංවිධාන

මෙරටේ මුලින්ම බිහිවූ ස්වේච්ඡා සංවිධාන කොටසක් නම් සමාජ සේවා සංවිධානයන් ය. උදාහරණයක් වශයෙන් පරෝපකාර මිතුරු සමාජය 1830 ගණන් වල සිට ක්‍රියාත්මක වේ. එයට අමතරව අනත් දරු, මහළු හා අංගවිකල නිවාස, සමාජසේවා කටයුතු, ළදරු මධ්‍යස්ථානය ආදිය පවත්වා ගෙන යන ස්වේච්ඡා සංවිධාන මෙම සියවසේ මුල් භාගයේ සිට බිහිවී ඇත. ලංකා සමාජ සේවා ලීගය (1914) අඳ ගොළු බිහිරි පාසැල (1912) ශ්‍රී ලංකාධාර සමිතිය (1922) මීට නිදසුන් ය. මෙහිදී සමාජ සේවා කටයුතු වලට අධ්‍යාපනික හා පුහුණු වැඩ සටහන් එක්කර තිබීම දක්නට ලැබෙන විශේෂ අංගයකි. දේශීය සංවිධාන මෙසේ බිහි වෙද්දී, ශාන්ත ජෝන් ගිලන්රථ හමුදව (1905) බාලදක්ෂ ව්‍යාපාරය, (1917) හා රතුකුරුස සමාජය (1936) වැනි අන්තර් ජාතික සමාජ සේවා සංගමයන්ගේ ක්‍රියා කාරිත්වයන්ද මෙරටේ පැතිරිණ.

### iii. කාන්තා සංවිධාන :

මෙම සියවසේ මුල් දශක දෙක දක්වා පැවැති කාන්තා සංවිධාන සියල්ලම නාගරික අවශ්‍යතා සපුරාලන එවා වූ අතර, ග්‍රාමීය කාන්තාවන් පිළිබඳ එම සංවිධාන වල අවධානය යොමු නොවිණි. මෙම තත්ත්වය වෙනස් කිරීමෙහි ලා වැදගත්ම පියවර වූයේ, ග්‍රාමීය අංශයේ ස්ථාවර සංවර්ධන වැඩ පිළිවෙලවල් සහිත පළමුවන ස්වේච්ඡා සංවිධානය ලෙස සැලකිය හැකි ලංකා මහිලා සමිතිය 1930 දී බිහිවීමය. ස්වයං රැකියා හා ආර්ථික කටයුතු සඳහා කාන්තාවන් පුහුණු කිරීම, දේශීය සම්පත් උපයෝගී කර ගනිමින් කෘෂිකර්මය, සත්ව පාලනය අත්කම් හා ගෘහ කර්මාන්ත සඳහා කාන්තාවන් පුහුණුකිරීම, පෙර පාසැල් අධ්‍යාපනය, ගෘහ විද්‍යාව, සෞඛ්‍ය හා පෝෂණය වැනි ක්ෂේත්‍රවල වැදගත් සේවාවන් ඉටු කළ මෙම ආයතනය, 1948 දී කඩුවෙල දී අංග සම්පූර්ණ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී. මෙම සමිතිය පිළිබඳව සඳහන් කළයුතු තවත් වැදගත් අංගයක් වන්නේ කාලයත් සමග මෙය ව්‍යාපාරයක් බවට පත්වීමය. 1932 දී සමිති 12 කින් ඇරඹි මෙම සංවිධානය 1948 දී 125 දක්වාද, 1960 දී 1400 දක්වාද, 1983 දී සමිති 2800 දක්වාද ව්‍යාප්ත විය.

1944 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා කාන්තා සම්මේලන මෙ රටේ බිහිවූ කාන්තා සමිති රාශියක් එක්කළ සම්මේලනයක් විය. අන්තර් ජාතික කාන්තා සම්මේලන යට අනුබද්ධ මෙම සම්මේලනය, වටා කාන්තා සමිති හා කණ්ඩායම් 40 ක් පමණ එක්වී ඇත.

### Iv. ගොවිජන සංවිධාන

සුළු ගොවි ජනතාව සම්බන්ධ සංවිධාන රාශියක් කලින් කලට ඇතිවී ක්‍රියා විරහිතවී ඇති අතර, මෙම ක්ෂේත්‍රයෙහි සැලකියයුතු සංවිධානයන් වන්නේ 1943 දී බිහිවූ සමස්ථ ලංකා ගොවි සම්මේලන යයි. 'වෘත්තීය සමිති' ආකාරයේ සංවිධානයක් වන මෙය දිවයිනේ ප්‍රදේශ රැසක ක්‍රියාත්මක වේ.

### v. සමාජ සේවා ව්‍යාපාර

පෙර සඳහන් කළ පරිදි 1930 ගණන් වල පැවැති මැලේරියා වසංගතය නිසා ග්‍රාමීය හා නාගරික දිළිඳු ජන කොටස් වල සමාජ සුබසාධන වැඩ පිළිවෙලක අවශ්‍යතාවය පෙනී ගියේය. මෙම අවශ්‍යතා සපිරීමට ස්වේච්ඡා සංවිධාන රාශියක් බිහිවිය. රජය විසින්ද මෙම තත්ත්වයට පිළියම් සෙවීම සඳහා 1930 දී දිළිඳු ජන ආඥා පණත වැනි සුබසාධක අණපනත් පනවමින් පියවර රැසක් ගන්නා ලදී. මෙම වාතාවරණය මත සමාජ සේවා කටයුතු වල නියැලි සංවිධාන 1946 දී සමාජ සේවා මධ්‍යම බල මණ්ලය පිහිටුවා ගන්නා ලදී. ආරම්භයේ සිටම මෙම බල මණ්ඩලය සමාජ සේවා කටයුතු පිළිබඳව රජයේ නිල නොවන උපදේශකයා ලෙස කටයුතු කළේය. මෙම බල මණ්ඩලයේ ඉල්ලීමක් අනුව මෙරටේ සමාජ සේවා කටයුතු පිළිබඳ පරීක්ෂා කිරීමට කොමිෂමක් පත් කරන ලද අතර, එහි නිර්දේශයක් අනුව 1948 දී සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවන ලද බව 1947 අංක 8 දරණ පාර්ලිමේන්තු සැසි වාර්තාවේ සඳහන් වේ. මෙම සංගමයේ තවත් වැදගත් ජයග්‍රහණයක් වූයේ 1951 දී සමාජ සේවකයන් පුහුණු කිරීම සඳහා සමාජ සේවා ආයතනයක් පිහිටුවීමය.

### vi. සමූපකාර ව්‍යාපාරය .

මෙරට ඉතිහාසයේ පැරණි ස්වේච්ඡා සංවිධානයක් වන ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය ආරම්භ වූයේ 1911 දී සමූපකාර ණය ගණුදෙනු පනත සම්මත කිරීමෙන් අනතුරුව පළමුවන ණය ගනුදෙනු සමූපකාර සමිතිය 1912 දී පිහිටු වීමෙනි. එහි ඉතිහාසයේ මුල් තිස්වසර තුළදී අරමුණු පැහැදිලිව තේරුම් ගෙන තිබිණ. ලංකාවේ සමූපකාර ව්‍යාපාරය පරීක්ෂා කිරීමට 1970 දී පත්කළ රාජකීය කොමිෂමවාර්තා කරන ලද ආකාරයට ගම් මට්ටමේ ජනතාවගේ කුඩා හා විශේෂිත කණ්ඩායම් වලින් සමන්විත ස්වේච්ඡා ව්‍යාපාරයක් බිහි කිරීම එහි අරමුණ ය. මෙමගින් ආර්ථික අවශ්‍යතා ඉටු කිරීම පිණිස එම ව්‍යාපාරයට අවශ්‍ය විශ්වාසය හා අත්දැකීම් ලබා ගත්තේය.

1942 දී ද්විතියන මට්ටමේ සමූපකාර සංවිධාන තුනක් පිහිටුවන ලදී. ඒවා නම් කොළඹ දිස්ත්‍රික් සමූපකාර සංගමය, පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිති සංගමය හා උතුරු පළාතේ කෘෂි භෝග නිපදවන්නන්ගේ සමූපකාර සමිතියයි.

දෙවන ලෝක මහා සංග්‍රාමයත් සමගම ඇරඹි, සමූපකාර ව්‍යාපාරය යේ දෙවන පියවර ලෙස සැළකිය හැක්කේ සමූපකාර පාරිභෝගික සමිති පිහිටුවීමයි. 1958 දී පාරිභෝගික භාණ්ඩ බෙද හැරීම, ණය සැපයීම හා නිෂ්පාදන අලෙවි කිරීම වැනි පුළුල් පරමාර්ථ ඇතිව විවිධ සේවා සමූපකාර සමිති පිහිටුවන ලදී. මෙම ව්‍යාපාර විවිධ මට්ටම් වලට පැතිර තියේය. 1955 දී ශ්‍රී ලංකා සමූපකාර මහා සංගමය පිහිටුවන ලද අතර, කෘෂි නිෂ්පාදන, ධීවර, කර්මාන්ත, පාරි භෝගික හා පොල් නිෂ්පාදන වැනි අංශවල ජාතික මට්ටමේ සංගම්ද මේ අනුව බිහිවිය.

### vii. ග්‍රාම සංවර්ධන සමිති :

1940 දී එවකට පැවැති වාණිජ හා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ශාඛාව මගින් ආරම්භ කරන ලද ග්‍රාමීය සුබසාධක මධ්‍යස්ථාන වල පලයක් මෙන් බිහි කෙරුණු මෙම සමිති ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් සංවිධාන කෙරුණ ග්‍රාමීය මට්ටමේ කණ්ඩායම් වලින් සමන්විත ඒවා වෙයි. 1947 දී රජය මගින් මෙම ආයතනය උපයෝගී කරගෙන අත්තම් ක්‍රමයේ ග්‍රාම සංවර්ධන වැඩ සටහනක් ආරම්භ කරන ලද අතර, 1952 දී කාන්තා සමිති අරඹන ලදී. රජය මගින් මෙම සමිති වලට පුහුණුව හා ආධාර සපයන ලද අතර, 1948 දී 3000 කින් පමණ සමන්විත වූ සමිති සංඛ්‍යාව දැන් 10,000 දක්වා විහිදී ඇතැයි වාර්තාවේ.

### viii පවුල් සංවිධාන හා සෞඛ්‍යය

පවුල් සංවිධාන කටයුතු මෙරටේ ආරම්භ කරන ලද්දේ 1953 දී පිහිටුවන ලද ස්වේච්ඡා ආයතනයක් වන පවුල් සංවිධාන සංගමය මගිනි. පවුල් සංවිධානය ජාතික ප්‍රතිපත්තියක් බවට රජය 1955 දී ප්‍රකාශයට පත් කර එම අංශයෙහි නියැලීම ආරම්භ කළේ 1968 දීය. මෙම අතරතුර කාලයේදී මෙම සංවිධානය විසින් සෞඛ්‍ය අංශයේ සේවා රැසක් ඉටු කරන ලදී. මෑතදී මෙම සංවිධානය ගම් මට්ටමේ සංවර්ධන කටයුතු රැසක නියැලී ඇත.

1959 දී ආරම්භ කරන ලද සෞඛ්‍ය දන ව්‍යාපාරය ප්‍රජා සෞඛ්‍ය අධ්‍යාපනය සෞඛ්‍ය ස්වේච්ඡා සේවකයන් පුහුණු කිරීම, සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් දියත් කිරීම වැනි වැඩ කටයුතු වලින් සෞඛ්‍ය හා ප්‍රජා සංවර්ධන කටයුතු ඒකාබද්ධ කිරීමට පියවර ගෙන ඇත.

### ix. සර්වෝදය ව්‍යාපාරය :

1950 ගණන් වල අග භාගයේ දී සර්වෝදය ශ්‍රමදාන සංගමය උපත ලැබිය. 1958 දී කනතොළුව නම් නොදියුණු ගමක ප්‍රජා වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම තුළින් ආරම්භ කරන ලද මෙම සංගමය පසු කලෙක ජාතික මට්ටමේ සංවිධානයක් බවට පත්වී දැන් තුන්වන ලෝකයේ විශාලතම ස්වෙච්ඡා සංවිධාන ය බවට පත්වී ඇත. දේශීය සංස්කෘතික හා ආගමික ලක්ෂණ වලින් හෙබි මෙම සංගමය මුල් දස වසර තුළදී ශ්‍රමදාන කටයුතු පදනම් කරගෙන ගම දියුණු කිරීමේ කටයුතු වල නියැලීමේ ප්‍රමුඛත්ව යක් ගෙන කටයුතු කලේය. 1968 දී ආරම්භවූ දෙවන දශකයේ දී පවුල සංවර්ධනය කිරීම තුළින් ගම දියුණු කිරීමේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වූ අතර, දිවයිනේ බොහෝ ගම්මාන වලට මෙම සේවය ව්‍යාප්ත වී ඇත. මෙම සේවාව වෙනුවෙන් මෙම ආයතනයේ නිර්මාතෘවරයාට රැමෝන් මැග්සායේ වැනිත්‍යාග හිමිව ඇත.

## 2. 1970 සිට මේ දක්වා

මෙරටේ ස්වේච්ඡා සංවිධාන බිහිවීම හා කටයුතු ව්‍යාප්ත වීම සීඝ්‍රවීමේ අවධිය 1970 වසරින් ආරම්භ විය. සම්ප්‍රදායික සංවර්ධන ක්‍රියාවලිය තුළින් ගම්බද ජනතාවගේ ජීවන තත්ත්වයෙහි වර්ධනයක් ඇති නොවීම, දිළිඳු බව වර්ධනය වීම වැනි හේතු නිසා ස්වේච්ඡා සංවිධාන වල කාර්ය භාරය පුළුල් කිරීමට සිදුවීම මෙයට හේතුවිය. එයට අමතරව රජය මගින්ද ග්‍රාම සංවර්ධන කාර්ය භාර ඉටු කිරීම සඳහා ආයතන රැසක් බිහි කරන ලදී.
එවා අතර –

- ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල පිහිටුවීම (1977 මෙම මණ්ඩල අහෝසි විය.)
- 1972 හා 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත් මගින් ජනාවාස ඇති කිරීම,
- කෘෂිකාර්මික පලදාවර්ධන පනත හා ගොවිජන සේවා (සංශෝධිත) පනත මගින් ගොවිජන අංශයේ නව ආයතන බිහි කිරීම.
- බලය විමධ්‍යගත කිරීම සඳහා පිළි වෙලින් දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය, දිස්ත්‍රික් අමාත්‍යවරු හා පළාත් සභා පිහිටුවීම.
- ග්‍රාමෝදය මණ්ඩල පිහිටුවීම
- දිස්ත්‍රික් මට්ටමේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තා හා ළමා ලේකම් කාර්යාංශ බිහි කිරීම
- ගම් මට්ටමේ නව ප්‍රජා සංවර්ධන කටයුතු කෙරෙන ගම් උදව ව්‍යාපාරය.
- දිළිඳු ජන කොටස් නගා සිටුවීම සඳහා ජනසවිය ක්‍රියාත්මක කිරීම.

රජය මෙබඳු වැඩ සටහන් ක්‍රියාත්මක කරද්දී පෙර සඳහන් කළ පරිදි, ස්වේච්ඡා සංවිධාන වල කටයුතු වඩාත් ව්‍යාප්ත විය. උදාහරණයක් වශයෙන් සර්වෝදය ශ්‍රමදාන සංගමය වත්මන් දියුණුව ලැබුවේ මෙම අවධියේදීය.

එලෙසින්ම මෙම කාලය තුළදී වැදගත් ස්වේච්ඡා සංවිධාන රාශියක් බිහිවීම දැකිය හැක. ඒවා අතර සංවිධාන කිහිපයක තොරතුරු බිඳක් පහත දක්වේ

### අ. ජාතික උරුමය

1975 දී ආරම්භවූ ජාතික උරුම යෙහි අරමුණු වූයේ භික්ෂූන් වහන්සේ මුල් කරගෙන පන්සල හා ගම අතර සම්බන්ධය තුළින් සමාජ ආර්ථික තත්ත්වය දියුණු කිරීමය. වැව් හා වාරිමාර්ග පිළිස කර කිරීම, මෙහි ප්‍රධාන කාර්යය විය. ආරම්භයේ දී සාර්ථක වූවද වසර තුන හතරක් ගත වෙද්දී මෙම ව්‍යාපාරය අභාවයට ගියේය. ව්‍යාපාරය ආයතන ගත කිරීමට නොහැකි වීම, එක් අයෙකු මත රැඳී සිටීමට සිදුවීම මෙම බිඳ වැටීමට හේතු ලෙස දැක්විය හැකිය. මෙම ආයතනයේ සේවය කල තරුණ පිරිසක් විසින්, ග්‍රාම සංවර්ධනය, ස්වභාවික සම්පත් රැකීම, පරිසර සුරැකුම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යන ක්ෂේත්‍රවල කටයුතු කරනු පිණිස ජාතික සංවර්ධන පදනම පිහිටුවා ගන්නා ලදී.

විශ්ව විද්‍යාල සිසුන් විසින් ගම් දියුණු කිරීමේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ ජාතික ගොඩ නඟන්නන් ගේ සංගමයද 1970 ගණන් වල සිට කෘෂි කර්මය, වාරිමාර්ග හා ජලපාලනය, ගෘහ කර්මාන්තය, රුක් වගාව, තරුණ කටයුතු යන ක්ෂේත්‍ර වල විවිධ මෙහෙයන් ඉටු කොට ඇත.

**ආ. සමූපකාර ණය දෙන සමිති**

විවිධ හේතූන් නිසා අකර්මන්‍යව තිබූ මෙරටේ පළමුවැනි ස්වේච්ඡා සංවිධානය වූ සමූපකාර ණය දෙන සමිති 1970 අග භාගයේ දී එක් සංවර්ධන ක්‍රියා කාරකයෙකුගේ මෙහෙයවීමෙන් නැවතත් ප්‍රති සංවිධානය වී දිස්ත්‍රික් මට්ටමේ සංවිධානයක් බිහි කෙරිණ. කෑගල්ල දිස්ත්‍රික්කයේ සාර්ථක වූ මෙම වැඩ පිළිවෙල අනෙක් දිස්ත්‍රික්ක වලටත් පැතිර යාමෙන් සමස්ත ලංකා සමූපකාර ණය දෙන සමිති සම්මේලනය බිහිවිය.

පහල සිට ඉහළට බලය ගලා එන මෙම සමාජ තුන් දහසකට ආසන්න සංඛ්‍යාවක් පිහිටුවා ඇත.

**ඇ. සාමයික සංවිධාන**

පෙර අධ්‍යාපනය හා සමාජ සේවා කටයුතු වල නියැලුන ක්‍රිස්තියානි සාමයික ආයතන 1960 ගණන් වල සිට සමාජ සාධාරණය, සංවර්ධනය හා විමුක්තිය යන ක්ෂේත්‍රවල කට යුතු වල නියැලීමට පටන් ගන්නා ලදී. සමාජ හා සාමයික කේන්ද්‍රය, සමාජ හා ආර්ථික සංවර්ධන මධ්‍යස්ථානය හා සතොයාදය බිහිවීම මෙයට නිදසුන්ය.

1950 ගණන් වල සිට නාගරික හා වතු අංශයේ කටයුතු කළ ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය මගින් ග්‍රාමීය සංවර්ධන හා විකල්ප ගොවිතැන් කටයුතු වර්ධනය සඳහා 1979 දී ගැමි සේවා සෙවන පිහිටුවන ලදී.

**ඈ. පර්යේෂණ සංවිධාන.**

ස්වෙච්ඡා ක්ෂේත්‍රයෙහි පර්යේෂණ ආයතන බිහිවීමද මෙරටේ දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයකි. 1972 දී බිහිවූ මාර්ග ආයතනය, මෙරට කැපී පෙනෙන පර්යේෂණ සංවිධානයක් බවට පත්ව ඇත. පර්යේෂණ, ලේඛණ ගත කිරීමේ, සම්මන්ත්‍රණ ආදි කටයුතු මෙන්ම කාර්ය බද්ධ ග්‍රාම සංවර්ධන වැඩ සටහන්ද මෙම ආයතනය මගින් අරඹා ඇත.


ශ්‍රී ලංකාවේ ගොවිකටයුතු පද්ධති හා ගොවිජන වෙනස්වීම් පිළිබඳව පර්යේෂණ පවත්වනු ලබන සමාජ විද්‍යාඥයන්ගේ සංගමයද මෙම ගණයට වැටෙන තවත් සංවිධානය කි. කාන්තා කටයුතු පිළිබඳ පර්යේෂණ ආයතනය (සෙන්වෝර්) මෙම ක්ෂේත්‍රයට එක්වූ කාන්තාවන් පිළිබඳ පර්යේෂණ පවත්වන තවත් ආයතනයක් වෙයි.

**එ. විදේශ ආයතන වල ශාඛා :**

මෙම කාලය තුළ ඇතිවූ තවත් විශේෂිත අංගයක් නම් විදේශික ස්වේච්ඡා ආයතනවල ශාඛා රාශියක් මෙරටේ ග්‍රාමීය / ප්‍රජා සංවර්ධන කටයුතු වල නියුතු වීමය. මේවා අතර රෙඩ් බානා, ලෝක දර්ශන ජාත්‍යන්තරය, අන්තර් ජාතික මානව ආධාර වැඩ සටහන කෙයාර් හා ප්ලෑන් ඉන්ටර් නැෂනල් ආයතන ප්‍රමුඛත්වයක් ගනී.

**ඒ. සහභාගිත්ව සංවර්ධන පර්යේෂණ ආයතනය (පිඩා)**

1970 මැද භාගයේ දී ආසියානු පර්යේෂකයන් කණ්ඩායමක් විසින් කරන ලද සංවර්ධන පර්යේෂණයක ප්‍රතිඵලයක් වශයෙන් සොයා ගන්නා



පරිසරයේ මෙබඳු
සුන්දරත්වයන් රැකීම:
ප්‍රජා සංවිධාන නිරතවන
තවත් අංශයක්

ලද සමාජ විමර්ශන, විශ්ලේෂණය, හා ක්‍රියාකාරිත්වය යන අංග වලින් සමන්විත සහභාගිත්ව කාර්ය බද්ධ පර්යේෂණ මගින් තෝරාගත් දිළිඳු ජන කොටස් නගා සිටුවීමේ ක්‍රියාවලියන් 1980 දී පිහිටුවන ලද සහභාගිත්ව සංවර්ධන පර්යේෂණ (පිඩා) ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. හේන්, එළවළු ගොවියන්ගේ සංවිධානය ඇතුළු ග්‍රාමීය කලාප රාශියකද, නාගරික අඩු ආදයම් ක්ෂේත්‍රයෙහි ද සංවර්ධන ක්‍රියාවලියෙහි නියැලෙන පිඩා ආයතනය 1982 දී විකල්ප නෝබල් ත්‍යාගය හිමිකර ගත්තේය.

**ඌ. ජාත්‍යන්තරය සංවර්ධන නම්‍යතා සම්බන්ධතා (ඉරෙඩ්)**

1980 වසරේදී පිහිටුවන ලද මෙම ආයතනයේ වැඩ කටයුතු නව්‍යතාවයකින් යුතුය. මෙරටේ බිහි වන සුළු පරිමාණ ස්වෙච්ඡා ආයතන වලට නැගී සිටීමට හා ලෝකයට විවර වීමට වේදිකාවක් සැකසීම, දයක ආයතනවල ග්‍රහණයෙන් මිදී ස්වාධීනව කටයුතු කිරීමට ආධාර වනු වස් විකල්ප මූල්‍ය ක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම ගොවි, ධීවර, තාක්ෂණය වැනි විවිධ අංශවල අන්තර් ජාතික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය මෙහි මූලික වැඩ කටයුතු වලින් සමහරකි.

**එ. ඌව ග්‍රාම.**

උඩරට ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති මෙම සංවිධානය පිළිබඳ වෙනත් ලිපියක් මෙම කලාපයේ පලවන හෙයින් මෙහිදී විස්තර කරනු නොලැබේ.

**ඒ. පරිසරය සම්බන්ධිත ආයතන :**

1980 දශකයේ දී පාරිසරික ප්‍රශ්න පිළිබඳව ලෝකයේ අවධානය යොමු වීම නිසා පරිසර ආශ්‍රිත කාර්ය භාරයන් සඳහා වෙන් වූන රාජ්‍ය නොවන ආයතන රාශියක් බිහිවිය. ලංකා පරිසර ආයතනය, පාරිසරික පදනම, ලංකා වන ආරක්ෂක සංගමය, මේ අතර ප්‍රධාන තැනක් ගනී.

**3. මෙරටේ ස්වෙච්ඡා ආයතන ලබා ඇති අත්දැකීම :**

ඉහත ඡේදයන්හි විස්තර කළ අන්දමට මෙරටේ ස්වෙච්ඡා ආයතන ජයග්‍රහණ රාශියක් හිමිකර ගෙන ඇත. එයින් ප්‍රධාන තැනක් ගන්නේ මෙරටේ ස්වෙච්ඡා සංවිධාන රැසක සේවයට ජාත්‍යන්තර සංවිධාන වලින් හිමිවී ඇති ගෞරවයයි. උදාහරණයක් වශයෙන්, පෙර සඳහන් කළ පරිදි, සර්වෝදය ව්‍යාපාරයට පිලිපීනයේ රැමොසාන් මැග්සාසේ ඇතුළු අන්තර් ජාතික ත්‍යාග රැසක් හිමිවිය. විකල්ප නෝබල් ත්‍යාගය ආරම්භ කළ වසරේදීම පිඩා සංවර්ධන පර්යේෂණ ආයතනයට එම ත්‍යාගය හිමිවීමද තවත් වැදගත් සිද්ධියක් වෙයි.

දෙවැන්න මෙරටේ සංවර්ධන අත්දැකීම් නිසා ස්වෙච්ඡා ආයතන වල සාමාජිකයනට සිය සේවය එතෙරටද ලබා දීමට හැකියාවන් උදාවීමය. උදාහරණයක් වශයෙන් සමූපකාර ණය දෙන සමිතිවල සභාපති වරයාට ආසියානු ණය දෙන ආයතන සම්මේලනයේ සභාපති පදවිය හිමිවූ අතර, සර්වෝදය ආයතනයට ලැබුන එබඳු අවස්ථා ඉමහත්ය. අප්‍රිකා මහාද්වීපයට සංවර්ධන කටයුතු පිළිබඳව උපදේශක සේවා වන් පිඩා ආයතනය මගින් සපයන ලදී.

මෙයට අමතරව, ඉහතින් සඳහන් කළ පරිදි මෙරටේ සංවර්ධන ක්ෂේත්‍රයෙහි විවිධ මුහුණුවරින් සංවර්ධන කාර්යයන් ස්වෙච්ඡා සංවිධාන මගින් ඉටු කරනු ලබයි. මෙබඳු සේවාවක් ඉටු කළද, මෙරටේ ජනතාවගේ සංවර්ධන අවශ්‍යතා වලට සරිලන සේවාවක් මෙරටේ ස්වෙච්ඡා ආයතන වලින් ඉටු වන්නේද යන්න පැන නැගිය යුතු ප්‍රශ්ණයකි. මෙම ප්‍රශ්ණය වඩාත් නිරවුල්ව තේරුම් ගනු පිණිස මෙරටේ ස්වෙච්ඡා සංවිධාන වල කටයුතු පිළිබඳව දළ වශයෙන් හෝ විමසීමක් කිරීම අවශ්‍ය වෙයි. මෙම ආයතන වල කටයුතු ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදිය හැකිය. පළමුවැන්න සංවර්ධන ක්‍රියාකාරකම් මූලික කරගත් ආයතන හා දෙවනුව සේවා සුභසාධක කටයුතු මුල් කරගත් ආයතන වශයෙනි. පළමුවැනි කොටසට, ප්‍රජාවගේ පලදායිතා හැකියාවන් අයත් වෙයි. ඉඩම්, මූලධනය, තාක්ෂණය, නිපුනතාවයන් සහ යෙදවුම් වැනි සම්පත් ලබා ගැනීමට ආධාර කිරීම හා අලෙවිය, සංවිධානය හා දැනුම පිළිබඳව ඇති බාධා ඉවත් කිරීම තුළින් සම්පත් උපයෝගී කර ගැනීම වර්ධනය කිරීම මෙමගින් සිදුවේ.

දෙවැනි කොටසේ කාර්ය භාරයන්ට, පොදු පහසුකම්, සෞඛ්‍ය, සනීපාරක්ෂාව, පෝෂණය, ළදරු උයන් පැවැත්වීම හා නිෂ්පාදනයට අත නොගසා වෙනත් ආධාර සැපයීම අයත් වෙයි. මෙලෙසින් සඳහන් කළේ වුවද, බොහෝ සංවිධාන මෙම අංශ දෙකෙහිම නිරත වෙති.

මෙබඳු සෘජු ආධාර මගින් ජනතාවගේ සුබසාධනය ඉක්මණින් වර්ධනය වන්නේ වුවද ප්‍රජාවගේ නිෂ්පාදන හැකියාවන් වර්ධනය නොකර එබඳු සුබසාධනයන්හි පල දීර්ග කාලීනව නෙලා ගත නොහැකි බව අත්දැකීම් වලින් පෙනේ. මෙරටේ ස්වෙච්ඡා සංවිධාන වල ක්‍රියාවලීන් න්‍යායාත්මක වශයෙන් පහත සඳහන් ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය.

| අ. කාණ්ඩය | ආ. කාණ්ඩය |
| --- | --- |
| 1. සියළු ප්‍රජාවන් එක් ඒකකයක් ලෙස සළකා කටයුතු කිරීමේ පුළුල් සහ ඒකාබද්ධ ප්‍රවේශය. | 1. ඉලක්ක කණ්ඩායම් උදාහරණ – දූප්පත්, වරප්‍රසාද රහිත, සීමිත කොටස් තෝරාගෙන කටයුතු කිරීමේ තෝරාගත් කොටස් පිළිබඳ ප්‍රවේශය. |
| 2. ගැටුම් වලින් තොර සමාජ ආර්ථික තත්ත්වයන් ඇත යන හැඟීමෙන් සුහදතා සංවර්ධන අනුරුව අනුව කටයුතු කිරීම. | 2. අසමාන පාලිත හා පාලක සමාජ ආර්ථික රටාවක් ඇත යන හැඟීමෙන් කරන අර්බුද විසඳීමේ සංවර්ධන අනුරුව අනුව කටයුතු කිරීම. |
| 3. ජනතාවගේ ලබා ගැනීමේ හැකියාව වර්ධනය නොකර බෙදහැරීමේ ක්‍රමය වර්ධනය කිරීමෙන් ජනතාවගේ එක් එක් පුද්ගලයන් යමක් ලබා ගැනීමේ නියෝජිතයන් ලෙස කටයුතු කිරීම. | 3. සම්පත් ලබා ගැනීමට කණ්ඩායමක් ලෙස ජනතාව දියුණුකිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම හා සංවිධාන කිරීම. |
| 4. ව්‍යාපෘති මූලික කරගත් ප්‍රවේශය. | 4. ජනතාවගේ ස්වශක්තිය වර්ධනය කරනු පිණිස ඔවුන්ගේ කේවල් කිරීමේ ශක්තිය වර්ධනය කිරීමේ ක්‍රියාවලිය. |

මෙරටේ ජනතාවගෙන් බහුතර කොටසක් දිළිඳු භාවයෙන් පෙලෙන බව තේරුම් ගෙන ඒ සඳහා පිලියම් වශයෙන් එම දිළිඳු කොටස සඳහාම විශේෂ සංවර්ධන ව්‍යාපාරයන් රජය විසින්ද අරඹා ඇති මෙම අවස්ථාවේදී ස්වෙච්ඡා සංවිධාන වල කාර්ය භාරය වියයුතු වන්නේ :

පුළුල් සංවර්ධනයක් - අවශ්‍ය, අවම වරප්‍රසාද සහිත ජනතාවට ලබා දීම, නිසා ඒ සඳහා දෙවැනි කාණ්ඩයේ ක්‍රියාවලිය සුදුසු බව දකුණු ආසියාවේ පමණක් නොව මුළු තුන්වැනි ලෝකයේම අත්දැකීම් වලින් පැහැදිලිය. (මෙම කලාපයේ මැද පිටුවල පළවන දකුණු ආසියාවේ අත්දැකීම් පිළිබඳ ලිපිය බලන්න)

මෙම ක්‍රියාවලිය වඩාත් උචිත යැයි පෙනී යාමට ප්‍රධාන හේතු සාධකයක් වෙයි. එය නම් සමාජය සමස්ත ඒකකයක් ලෙස සළකා ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ක්‍රියාවලියන් තුළින් යහපත උදා වෙන්නේ එම ජන කොටසේ දැනටම වරප්‍රසාද හිමිව සිටින කොටස් වලට බව පෙනී යාමය. එමගින් එම ජන කොටස් වල වරප්‍රසාද තවදුරටත් වර්ධනය වන අතර එමගින් එම ජන කොටසේ සිටින වරප්‍රසාද රහිත ජනතාවත් මෙම සහන ලැබෙන ජන තාවත් අතර පරතරය වඩාත් පුළුල් වේ. සංවර්ධනයේ පරමාර්ථය වනුයේ ජන කොටස් සියල්ලටම පාහේ යහපත් ජීවන තත්ත්වයක් උදාකර දීම නම් මෙම ක්‍රියාවලියෙන් සිදුවන්නේ එයට ප්‍රති විරුද්ධ ක්‍රියා දමයකි. මන්දයත් සංවර්ධන බලාපොරොත්තු වලට විරුද්ධ ක්‍රියා වලියක් එමගින් සිදුවන බැවිනි. තෝරාගත් දිළිඳු ජන කොටස් සංවිධාන කිරීම වඩාත් උචිත යැයි හැගෙන්නේ, වරප්‍රසාද නොලත් එම ජනතාව නිෂ්පාදනයට හවුල් කර ගැනීම තුළින් එම ජන කොටස් වලට ආදායම් ලැබීමෙන්, එම ජන කොටස් වලට අවශ්‍ය සේවා සැපයීම මගින් අනෙක් ජන කොටස් වල ආදායම්ද වර්ධනය කර ගැනීමට ඉඩකඩ සැළසෙන බැවිනි.

ස්වෙච්ඡා සංවිධාන බිහිවීමට හේතු සාධක වූ කරුණු පිළිබඳව එක් පිළිගත් මතයක් නම් රාජ්‍ය අංශයේ සංවර්ධනය ජනතාවට ප්‍රමාණවත් නොවේය යන්නය. එසේ නම් රාජ්‍ය අංශයේ ක්‍රියා කාරිත්වය පමණටම ස්වෙච්ඡා ආයතනවල ක්‍රියා කාරිත්වයද පුළුල් විය යුතුය, යන්න පිළිබඳව විවාද අවශ්‍ය නොවේ. එහෙත් ශ්‍රී ලංකාවේ ස්වෙච්ඡා සංවිධාන වල ක්‍රියාකාරිත්වය රාජ්‍ය අංශය සමඟ කිසි සේත් ප්‍රමාණවත් ව කළහැකි නොවේ. මෙයද අවධානය කළයුතු අංශයක් වෙයි.

විදේශයන්හි ස්වෙච්ඡා සංවිධාන හා සැසඳීමේදී මෙරටේ ස්වෙච්ඡා සංවිධාන පිළිබඳව පෙනී යන තවත් කරුණක් නම් මෙරටේ සංවිධාන බොහොමයක් සිය සංවර්ධන ක්ෂේත්‍රය එක් ප්‍රවේශයකට පමණක් සීමා කර පවත්වා ගෙන යැමය. උදාහරණ වශයෙන් යම් සංවිධානයක් පරිසරය ප්‍රශ්ණ, විකල්ප කෘෂිකර්මය, දිළිඳු ජනතාව නඟා සිටුවීම වැනි සිය සංවර්ධන ප්‍රවේශයන් වර්ධනය කිරීමට වෙහෙස දරනු බොහෝ විට දැකිය හැකිය. නව සංවර්ධනවේදීන් විසින් සංවර්ධනයට බහුවිධ ප්‍රවේශය අවශ්‍ය යැයි පෙන්වා දෙන මෙවැනි අවධියක විවිධ අංශ ඒකාබද්ධව සංවර්ධන කටයුතු පවත්වා ගෙන යාමට ප්‍රයත්න දැරිය යුතු බව විදේශ අත්දැකීම් වලින් පෙනේ.

මෙහිලා සඳහන් කළයුතු තවත් අංගයක් නම් ස්වෙච්ඡා සංවිධාන වල අන්තර් සබඳතාවයයි. මෙහි මුල් කොටස වන්නේ විවිධ ස්වෙච්ඡා සංවිධාන අතරම ඇතිවිය යුතු අන්තර් සබඳතාවයය. මේ සඳහා වැඩි ඉඩකඩක් හා හැකියාවක් දැන. වඩාත් සංකීර්ණ ප්‍රශ්ණය වන්නේ රජය හා ස්වෙච්ඡා සංවිධාන අතර පැවතිය යුතු සබඳතාවයයි. මෙරටේ මෙන්ම විදේශයන්හිද විවාදයට තුඩු දුන් මෙම ප්‍රශ්ණය පිළිබඳව තර්ක දෙකක් ඉදිරිපත් වී තිබේ. පළමු වැන්න රජයේ කටයුතු වලට ආදේශකයක් ලෙස කටයුතු කළයුතු බව කියැවෙන අදහසයි. ඉන් ඉදිරිපත් කෙරෙන්නේ රාජ්‍ය ආයතන වල කටයුතු කුමක් වූවද, ස්වෙච්ඡා ආයතන ස්වාධීන වැඩ සටහන් සහිතව සිය කටයුතු කළයුතුය යන්නයි. මෙමගින් ජනතාවට වඩාත් ක්‍රියාශීලී සංවර්ධන ක්‍රියා දමයකට ඉඩකඩ සැළසෙන බව පෙණෙන නමුදු, රාජ්‍ය කටයුතු වලට ප්‍රතිවිරුද්ධ බල වේගයක් ලෙස ඉතාම දුර්ලභ අවස්ථාවකදී වූවද ගම් සංවිධානයකට කටයුතු කළහැකි බවට ගාන්ධි ව්‍යාපාරය රජය මගින් තහනම් කිරීමෙන් පෙනේ. රජයට ආධාරකයක් විය යුතුය යන දෙවන මතයට විරුද්ධව නැගෙන තර්කය නම්, රාජ්‍ය සංවර්ධනයට විකල්පයක් ලෙස ගොඩ නැගුන ස්වෙච්ඡා සංවිධාන විසිනුත් රජයේ සංවර්ධන ප්‍රතිපත්තීන් හා ක්‍රියා වලියන්ම ක්‍රියාත්මක කරන්නේ නම් ස්වෙච්ඡා සංවිධාන වලින් සේවයක් සිදුවේද යන්නය. මේ පිළිබඳව තවත් ගැඹුරින් විශ්ලේෂණය කළ හැක්කේ වුවද, මෙම ප්‍රශ්ණය සුහදව විසඳා ගත යුතුව ඇත.

ස්වෙච්ඡා ආයතන වලට පමණක් නොව වෙනත් ආයතන වලට පොදු එක් කරුණක් මෙහිද සඳහන් කළයුතුව ඇත. එය නම් මානව සම්පත් සංවර්ධනයයි. බොහෝ ස්වෙච්ඡා සංවිධාන වල පුහුණු ක්‍රියාකාරකයන් නොමැති අතර එම සේවකයනට ලැබෙන දීමනා හා සේවා කොන්දේසි, එතරම් හිතකර බවක් පෙනෙන්නට නැත.

රාජ්‍ය නොවන ආයතන විසින් මුහුණ දිය යුතු ප්‍රධානතම අභියෝගයන් දෙකක් කෙරෙහි අවධානය යොමු කරවමින් මෙම ලිපිය අවසන් කළයුතු යැයි හඟමි. පළමු වැන්න, ජනතාව තුළ ස්වශක්තිය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියා කරන ස්වෙච්ඡා සංවිධාන විදේශීය දායක ආයතන වලින් බැහැරවී ස්වාධීන වියයුතු වීමය. දෙවැන්න ස්වෙච්ඡා ආයතන වල කාර්ය භාරය කොතරම් දුරට පවත්වා ගෙන යා යුතුද යන්නය. මෙම ප්‍රශ්ණ පැන නැගීමට හේතු වී ඇත්තේ සංවර්ධන ක්‍රියා දමයක අරමුණු වන්නේ වරප්‍රසාද රහිත කොටස් වලට එම වරප්‍රසාද ලබා ගැනීමට ඉඩ සැළසීම නම් - මූලික සංවර්ධන ක්‍රියා දමයෙන් බැහරවී හුදකලා ජීවිත ගත කරන පුද්ගලයන් නිෂ්පාදකයන් බවට පත්වී නිෂ්පාදනය ක්‍රියා වලියට හවුල් කර ගැනීම නම් එම ප්‍රශ්ණ විසඳා ජනතාව ආර්ථික ක්‍රියා වලියේ කොටස් කරුවන් වූ පසු මෙම සංවිධාන වල ක්‍රියාවලිය අවශ්‍ය නොවන හෙයිනි. ස්වෙච්ඡා සංවිධාන ස්වයං ඇවරකාරක ආයතන බව සඳහන් කළ යුත්තේ එහෙයිනි.

— ගුණරත්න රාමනායක —